**<u>අත්තනගල්ල ප්‍රාදේශීය සභාව</u>**
**<u>ගම්පහ දිස්ත්‍රික්කය</u>**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 08 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී ඇති පෝටෝන් වතුර බවුසරයෙහි සහ පෝටෝන් බැකෝ ලෝඩරයෙහි ගත් මිල හඳුනා නොගෙන රු.20,695,000 ක් වූ රක්ෂිත වටිනාකම ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද ත්‍රීරෝද රථ දෙක වෙනුවෙන් ගෙවියයුතු ලියාපදිංචි ගාස්තුව වූ රු.11,320 ක් වෙනුවෙන් ණය හිමියන් සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

(ඇ) 2013 සහ 2014 වර්ෂයන්හි සමීක්ෂණයෙන් ඉවත් කළ යුතු ලෙස හඳුනාගෙන ඇති පිළිවෙලින් රු.77,050 ක් හා රු.33,869 ක් වටිනා පුස්තකාල පොත් ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ රු 18,492 ක හිඟ අක්කර බදු ශේෂය ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) 2015 වර්ෂයේ එකතුව රු 771,066 ක් වූ සභා කර්මාන්ත 2 වෙනුවෙන් ණය හිමියන් සඳහා වෙන්කිරීම් කර නොතිබුණි.

(ඊ) එක් ගමකට එක් වැඩක් ව්‍යාපෘතිය යටතේ වූ රු.255,600 ක් වටිනා ව්‍යාපෘතිය වෙනුවෙන් ණය හිමියන් ලෙස වෙන් කිරීම් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී සභා කර්මාන්ත 9 ක ගිවිසුම්ගත වටිනාකම ණයහිමි ලෙස පෙන්නුම් කර නොතිබීම හේතුවෙන් ණයහිමි ගිණුමෙහි රු.145,004 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළදී ඉදිකරන ලද රු.6,445,552 ක් වූ ව්‍යාපෘති 11 ක වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(එ) ව්‍යාපෘති 23 කට අදාළව සියයට 10 ක රඳවුම් මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල ණය හිමියන් ලෙස පෙන්නුම් කර නොතිබීම හේතුවෙන් ණය හිමි ශේෂය රු 865,121 කින් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

1.3.2 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.29,590,263 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵලය</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,448,211 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.30,469,028 ක් විය.

2.2 **<u>මූල්‍ය පාලනය</u>**

(අ) ක්‍රීඩා පිටිය වෙන්කර ගැනීම සඳහා ආපසු ගෙවිය යුතු තැන්පත් මුදල සඳහා එවන ලද රු.25,000 ක් වටිනා චෙක්පත 2015 ජනවාරි 30 දින අගරු වී ඇති අතර එය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට රු.2,028,520 ක් වූ අත්තිකාරම් ශේෂය තුළ වසර 2 ඉක්මවා තිබූ රු.1,494,058 ක ශේෂයක් නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.

2.3 **<u>ආදායම් පරිපාලනය</u>**

2.3.1 **<u>ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම්</u>**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| --------------- | ---------------- | ------------ | ------------ |
| | රු.000' | රු.000' | රු.000' |
| වරිපනම් හා බදු | 16,297 | 22,626 | 16,939 |
| බදු කුලී | 8,289 | 10,920 | 6,696 |
| වෙළඳ බලපත්‍ර | 1,921 | 983 | 1,162 |
| වෙනත් ආදායම් | 72,753 | 74,986 | (952) |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 25.75 ක්වූ හිඟ හිටි ආදායමින් සියයට 66 ක් හිඟ වරිපනම් හා බදු වන අතර සියයට 26 ක් හිඟ කඩකුලීවලින් සමන්විත විය.

2.3.2 **වරිපනම් හා බදු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වරිපනම් බදු තක්සේරුව ප්‍රතිශෝධනය වර්ෂ 05 කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් කරවා ගත යුතු වුවත් 2003 තක්සේරුව පදනම් කර ගෙන වරිපනම් බදු අයකර තිබුණි. මේ හේතුවෙන් විශාල ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) එගොඩපොත හා මෙගොඩපොත උප කාර්යාලවලට අදාළව වරිපනම් බදු තක්සේරුවක් 2008 වර්ෂයේදී සිදුකරවා ගෙන තිබුණත් ඒ අනුව වරිපනම් බදු අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ඇ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාර පළාත් පාලන ආයතන සඳහා උපරිම වරිපනම් බදු ප්‍රමාණයක් ලබා ගැනීම පිනිස හැකිතාක් දියුණු ගම් ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට හැකි බල ප්‍රදේශ හඳුනා ගෙන ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.3.3 **කඩකුලී**

පහත කරුණු නිරීක්ෂණයකරනු ලැබේ.

(අ) ප්‍රජා ශාලාව ඉදිරිපිට පැවති කඩ කාමර 48 න් 2015 දෙසැම්බර් 31 දිනට පැවති රු.1,129,515 ක හිඟශේෂය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) වෙළඳසැල් 125 ක වර්ෂ දහයකට පෙර අයකරන ලද මාසික කුලිය වර්තමාන වෙළඳ පොළ මිල ගණන් අනුව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබූ අතර 2015 දෙසැම්බර් 31 දිනට රු.2,881,576 ක හිඟ කඩ කුලී අයකර ගැනිමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) 1980 දෙසැම්බර් 31 දිනැති පළාත්පාලන කොමසාරිස්ගේ අංක 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් වසර 5 කට වරක්වත් කඩ කුලිය තක්සේරු කල යුතුව ඇතත් එසේ කටයුතු කර නොතිබුණි.

2.3.4 **වෙනත් ආදායම්**

සභා බල ප්‍රදේශය තුළ ඇති සම්ප්‍රේෂණ කුළුණු සියල්ල හඳුනාගෙන 2009 අප්‍රේල් 17 දින අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය පාදක කර ගනිමින් අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීම තුළින් ආදායම් එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. උප කාර්යාල ප්‍රදේශයන්හි සම්ප්‍රේෂණ කුළුණු 25 ක් හඳුනාගෙන තිබුණු නමුදු ආදායම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **ආර්ථික නොවූ ගනුදෙනු**

එක ගමකට එක වැඩක්, ගම නැගුම, පළාත් නැගුම, පළාත් සංවර්ධන වැඩසටහන් යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති ව්‍යාපෘති, රාජකාරි නිවාඩු දිනවල ඉටුකිරීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් හා අතිකාල සඳහා රු.520,497 ක මුදලක් ගෙවා තිබුණි. මෙම ගෙවීමේදී පැමිණීම සහ පිටවීම ඇඟිලි සළකුණු යන්ත්‍රයේ සටහන් කර නොතිබීම, නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා සම්බන්ධයෙන් ලේඛනවලද සටහන් තබා නොතිබීම, ඉටු කරන ලද රාජකාරි කටයුතු පිළිබඳව විස්තරද ඉදිරිපත් නොකිරීම වැනි දුර්වලතා අනාවරණය විය.

3.2 **ඉඩම් අනුබෙදීම්**

සමාලෝචිත වර්ෂයේදී අක්කර 12 රූඩ් 2 පර්චස් 35.08ක ප්‍රමාණයෙන් යුත් පුවක්වත්ත නමැති ඉඩමේ අංක 10910 දරන සැලැස්ම අනුකොටස් බෙදීමේදී බිම් කැබැල්ලක් පර්චස් 12.5 හෝ ඊට වැඩි වියයුතු බව දන්වා ඇතත් කැබලි 166 කින් සියයට 75 ක්ම පර්චස් 10 කැබලි ලෙස වෙන්කර තිබුණි. පොදු පහසුකම් සඳහා වෙන්කර ඇති ලොට් අංක 173 හි පර්චස් 5.54 ක ප්‍රමාණයකින් යුත් ඇළ මාර්ගයක්ද ඇතුළත්ව තිබූ අතර පොදු පහසුකම් සඳහා වෙන්කර ඇති පර්චස් 84.82 ක ඉඩම ඔප්පුවකින් සභාව වෙත පවරා ගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමටද කටයුතු කර නොතිබුණි.

3.3 **අවිධිමත් ගනුදෙනු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ත්‍රීරෝද රථ මිලදී ගැනීමේදී 2015 මාර්තු 24 දින තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය දී තිබූ ආයතනයෙන් මිලදී නොගෙන වෙනත් පෞද්ගලික සමාගමක ඉල්ලීම මත 2015 අප්‍රේල් 24 පැවති මුදල් කමිටුව විසින් ඉල්ලීම් කරන ලද සමාගමෙන් රු.1,485,000 මිලදී ගැනීමට තීරණය කිරීම මත ත්‍රී රෝද රථ 3 ක් මිලදී ගෙන තිබුණි. 2015 සැප්තැම්බර් 20 වන විට මෙම රථවල එන්ජිම් දෝෂ, ගියර් පෙට්ටි දෝෂ අධික ලෙස රත්වීම ආදී දෝෂ හටගෙන අළුත්වැඩියාවන් සිදුකර ඇතත්, එම අඩුපාඩු එලෙසම පවතින බව රියදුරු විසින් වාර්තා කර තිබුණි. මිලදී ගැනීමේ පිරිවිතරයට අනුව ඉන්ධන පරිභෝජනය ලීටරයකට කිලෝ මීටර් 37 ට වැඩිවියයුතු බව දැක්වුවත් මෙම රථවල ඉන්ධන දහනය ලීටරයකට කි.මී.22 ක් පමණ විය.

(ආ) වාහන කුලී පදනම මත ලබා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා රු.1,912,125 ක වියදමක් දරා තිබුණි. කුලී පදනම මත ලබාගත් වාහන රාජකාරියේ යෙදවීම පිළිබඳ දෛනික ධාවන සටහන් පවත්වා නොතිබූ අතර, කුලී ගිවිසුම් අළුත් කිරීමක්ද කර නොතිබුණි.

(ඇ) සභාව සතුව ට්‍රැක්ටර් 10 ක් තිබියදීත් කුලී පදනම මත ට්‍රැක්ටර් ලබාගෙන 2015.01.01 සිට 2015.08.30 දක්වා කාල පරිච්ඡේදය රු.659,975 ක් ගෙවීම් කිරීම තුලදී විගණනයේදී මතභේදයට ලක්විය.

(ඈ) 2014 නොවැම්බර් 20 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ අංක 1889/32 දරන ගැසට් නිවේදනයේ 3(i) රීතියට පටහැනිව සභා රැස්වීම් සඳහා සහභාගී නොවූ සභිකයන් සඳහා රු.185,600 ක් ගෙවීම් කර තිබුණි.

3.4 **කොන්ත්‍රාත් පරිපාලනය**

3.4.1 **වේයන්ගොඩ නගරයේ ඉදිකර ඇති රංග ශාලාව**

1999 වර්ෂයේදී ගම්පහ දිස්ත්‍රික් නගර සංවර්ධන වැඩ සටහන යටතේ රුපියල් ලක්ෂ 248 ක ඇස්තමේන්තුවක් මත වේයන්ගොඩ නගර මධ්‍යයේ දුම්රිය ස්ථානයට මුහුණලා ඉදිකිරීමට නියමිත බහු කාර්ය ප්‍රජා ශාලා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2000 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2000 සිට 2012 වර්ෂය දක්වා රුපියල් ලක්ෂ 150 ක වියදමක් දරමින් ඉදිකිරීම් කටයුතු සිදුකර ඇති අතර, 2013 වර්ෂයේ බිම කොන්ක්‍රීට් කිරීම හා බිත්ති කපරාරුව රුපියල් ලක්ෂ 30 ක වියදමින් පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ කොන්ත්‍රාත් සමාගමක් මගින් සිදුකර තිබුණි.

(ii) 2016 මැයි 13 දින භෞතික විගණන පරීක්ෂාවේදී මෙම ගොඩනැගිල්ල රංග ශාලාවක් ලෙස ඉදිකිරීම සිදුකර ඇති බව නිරීක්ෂණය වූ අතර ප්‍රධාන ශාලාවට අමතරව එක පැත්තක බැල්කනියක් හා ඉදිරිපසින් වේදිකාවක්ද දෙපසින් බැල්කනියට හා වේදිකාවට ප්‍රවේශවීම සඳහා පඩි පෙළවල්ද සකස්කර තිබුණි.

(iii) පොළොවේ ප්‍රමාණයෙන් සියයට 60 ක් පමණ කොන්ක්‍රීට් කර තිබුණි. වේදිකාව ආසන්නයේ මැතකදී කපන ලද වලක් තිබූ අතර, සුදුහුණු පිරියම් කර තිබූ බැල්කනිය යට සම්පූර්ණයෙන්ම කළු පැහැති වී තිබුණි. ගොඩනැගිලි පරිශ්‍රය යාචකයන් පරිහරණය සඳහා යොදාගෙන තිබූ අතර බිම් මහල ගවයන්, බල්ලන් විසින් අපවිත්‍ර කර තිබුණි.

(iv) දිග අඩි 155 අඟල් 3 ක් හා පළල අඩි 73 ක්ද උස අඩි 20 කින්ද යුක්ත වූ මෙම ගොඩනැගිල්ල සඳහා 2015 ඔක්තෝබර් 14 දින සභා තීරණයක් මත රංග ශාලාව සඳහා ටෙන්ඩර් කැඳවා තිබුණි. ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් රු.74,000 ක තක්සේරු වටිනාකමක් ඉදිරිපත් කර තිබූ අතර කිසිදු ආයතනයක් ටෙන්ඩරය සඳහා ඉදිරිපත් වී නොතිබුණි.

(v) රජයේ අරමුදල් අනාර්ථික ලෙස භාවිත නොකරමින්, මෙම ගොඩනැගිල්ලෙහි ඉතිරි වැඩද නිම කර ප්‍රාදේශීය සභාවේ ආදායම් උත්පාදන මාර්ගයක් ඇතිකර ගනිමින් ජනතාව වෙත ඵලදායි සේවාවක් ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කළයුතු බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

3.4.2 **<u>ප්‍රමාද වී තිබූ ව්‍යාපෘති</u>**

සමාලෝචිත වර්ෂය තුළ රු.139,522,351 ක් වටිනා සභා කර්මාන්ත 493 ක් අනුමත වී තිබුණත් 2015 දෙසැම්බර් 31 දිනට ගිවිසුම්ගතවී තිබුණේ රු.2,775,269 ක් වටිනා කර්මාන්ත 343 ක් පමණි. ගිවිසුම්ගත කර්මාන්ත වලින් රු.77,229,695 ක් වටිනා කර්මාන්ත 294 ක් නිමකර තිබුණි.

(i) ගිවිසුම්ගතවී ඇතත් රු.5,925,454 ක් වටිනා ව්‍යාපෘති 20 ක් 2015 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක වී නොතිබුණි.

(ii) 2015 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන්ව ඇතත් මුදල් ගෙවා නොමැති රු.6,762,733 වටිනා ව්‍යාපෘති 27 ක් විය.

(iii) විවිධ මූලාශ්‍ර යටතේ ලද ව්‍යාපෘති වලින් 2014 වර්ෂයේ නිමකරන ලද ව්‍යාපෘති 19ක් සඳහා රු.22,140,289 ක මුදලක් විගණිත දිනය වූ 2016 මැයි 13 දින වන විටත් ප්‍රතිපූර්ණය වී නොතිබුණි.

3.5 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සපුගස්තැන්න මේෆිල්ඩ්වත්ත වෙන්දේසි ඉඩමේ ළමා උද්‍යානයක් ඉදිකිරීම සඳහා 2014 සහ 2015 වර්ෂවලදී එකතුව රු.1,227,408 ක් ගෙවීම් කර තිබුණද මෙම ඉඩම සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) එක් ගමකට එක් වැඩක් ව්‍යාපෘතිය යටතේ නිකහැටිකන්ද පානීය ජල ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.684,800 ක වටිනාකමට 2014 ඔක්තෝබර් 30 දින ගිවිසුම්ගතවී ඇතත් මෙම ව්‍යාපෘතිය 2015 වර්ෂයට අවිච්ඡේද කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.529,360 ක මුදලක් වැයකර ඇතත්, නව විදුලි සේවාවක් සැපයීම සඳහා උප පොලේ සිට ඇති දුර ප්‍රමාණය මීටර් 950 ක් වන සම්මත දුර ප්‍රමාණය ඉක්මවා ඇති හෙයින් විදුලි සැපයුම කල නොහැකි බව

2015 ඔක්තෝබර් 28 දින ප්‍රධාන විදුලි ඉංජිනේරු විසින් දන්වා එවා ඇතත් විගණිත දිනය වූ 2016 මැයි 13 දින වන විටත් ඉදිරි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාර සභා බල ප්‍රදේශයට අයත් මං මාවත්වල සැලැස්මවල් පිළියෙල කර නාම ලේඛනයක් ගැසට් පත්‍රයක් මගින් පළකර සභා අයිතියට පවරා ගතයුතු වුවත් 2012 වර්ෂය දක්වා මාර්ග 962 ක් මාර්ග ලේඛනයේ සඳහන් වූ අතර ඉන් පසුව නිමකළ මාර්ග ගැසට් කිරීමක් හෝ මාර්ග ලේඛනය යාවත්කාලීන කිරීමක් හෝ කර නොතිබුණි.

(ඇ) 1971 අංක 8 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතින් සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 16 වන වගන්තිය ප්‍රකාර කටයුතු නොකිරීම මත 2001 වර්ෂයේ සිට 2009 අගෝස්තු දක්වා කාල පරිච්ඡේදය තුළ සේවක අර්ථ සාධක අරමුදලට අදාළ දායක මුදල් යැවීම ප්‍රමාද කිරීම නිසා රු.453,392 ක අධිභාරයක්ද සේවා නියුක්ති භාර අරමුදලට 2002 සිට 2009 දක්වා කාලයට දායක මුදල් යැවීම ප්‍රමාද වීම මත රු.2,098 ක අධි ගාස්තුවක්ද ගෙවා තිබුණි.

## 3.6 <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

සමාලෝචිත වර්ෂය තුළදී කසළ අපහරණය සඳහා සභාව විසින් රු.51,795,889 ක වියදම් දරා තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වෙන් නොකරන ලද කසල ප්‍රමාණය දිනකට ටොන් 18-20 ක් වන අතර කොම්පෝස්ට් අංගනයට යවනු ලබන්නේ ටොන් 1 ත් 5 ත් අතර ප්‍රමාණයක් විය.

(ආ) 2011 ජූලි 05 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ 1713/11 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ iv(අ) කොටස ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා 22 වගන්තිය ප්‍රකාරව සඳහන් කර ඇති කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම කෙරේ සභාව පියවර ගෙන නොතිබුණි.

(ඇ) කොම්පෝස්ට් අංගනය මගින් 2015 වර්ෂය සඳහා කිලෝ ග්‍රෑම් 41003 ක ප්‍රමාණයක් කොම්පෝස්ට් අලෙවිකර රු.546,690 ක අලෙවි ආදායමක් ලබාගෙන තිබුණු නමුදු ඒ සඳහා රු.25,682,980 ක වියදමක් වර්ෂය තුළදී දරා තිබුණි. නිෂ්පාදන අඩාල වීමට සේවකයින් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම හේතු වූ බව වාර්තා වී තිබුණු අතර, පැමිණිමේ සටහන් අනුව ව්‍යාපෘති සේවයේ නිරත වූ සේවකයන්ට අමතරව වෙනත් සේවකයින් සඳහාද වර්ෂය තුළ එකතුව රු.1,545,250 ක් ගෙවීම් කර තිබුණි.

## 3.7 <u>පාරිසරික ගැටළු</u>

මහජන පැමිණිලි ලේඛනයේ 2014 වර්ෂයේ ලද පැමිණිලි වලින් පැමිණිලි 14 ක් හා 2015 වර්ෂයේ ලද පැමිණිලි 11 ක් සඳහා විසඳුම් ලබා දීමට අදාළ කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

4. <u>පද්ධති හා පාලනය</u>

පහත සඳහන් පද්ධතා හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය